## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයට අනුයුක්ත කාර්මික සහකාර නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - සංශෝධිත

### හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද කාර්ය පටිපාටික රීති I වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයට අනුයුක්තව දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන කාර්මික සහකාර නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය.

### 02.වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන්

I. කුමන ශ්‍රේණි වල නිලධාරීන් ද යන්න :
කාර්මික සහකාර III, II, I වන ශ්‍රේණියේ නිලධාරීන්

II. එක් එක් සේවා ස්ථාන වල සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේදයන්

- තමා දැනට සේවයේ යෙදී සිටින ආයතනයේ අඛණ්ඩව වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.

- එකම ආයතනයක ඛණ්ඩව හෝ අඛණ්ඩව වසර 05 කට වැඩි සේවා කාලයක් සේවය කර ඇති නිලධාරීන් සහ එකම දිස්ත්‍රික්කයක ඛණ්ඩව හෝ අඛණ්ඩව වසර 10ක සේවා කාලයක් (ස්ථාන මාරු සළකා බලන වසරට) සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

මීට අමතරව,ස්ථාන මාරුව ලබාදීමේදී සැළකිල්ලට ගනු ලබන විශේෂ කරුණු පහත පරිදි වේ.

- කලත්‍රයා ස්ථාන මාරු ලබා ගත නොහැකි සේවා ස්ථාන වල හෝ විදේශගතව සේවය කිරීම පාසල් යන දරුවන් ආබාධිත දරුවන් දීර්ඝ කාලීන ආතතිවලින් පෙළෙන කලත්‍රයන් හෝ වෙනත් පවුලේ සමීප ඥාතීන් සිටීම යන කරුණු පිළිබඳව ස්ථාන මාරු ලබා දීමේදී සළකා බලනු ලැබේ.

- සළකා බලනු ලබන වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් ලබා දී ඇති ප්‍රශංසා හා දෝෂ දර්ශන හා දඬුවම් සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

- එක් සේවා ස්ථානයක ඛණ්ඩව හෝ අඛණ්ඩව වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයෙකුට එම සේවා ස්ථානයේ තවදුරටත් සේවය කළ හැක්කේ වෙනත් නිලධාරියෙකු එම සේවා ස්ථානයට ඉල්ලීමක් සිදුකර නොමැති අවස්ථාවකදී පමණි.

- සේවා අවශ්‍යතාවය මත හෝ සුහද ස්ථාන මාරුදීම මත ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් ස්ථාන මාරුව ක්‍රියාත්මක වීම අනුව නව සේවා ස්ථානයේ වසර 02ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

- ස්ථාන මාරු අයදුම්කිරීම හා ස්ථාන මාරු සමාලෝචන කමිටුවලට කරුණු දැක්වීම නියමිත ආකෘතියෙන්ම විය යුතු අතර එසේ නොවන අයදුම්පත්‍ර හා කරුණු දැක්වීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. **ප්‍රමුඛත්වය ලබා දෙන ක්‍රමවේදයන් හා වෙනත් විශේෂ විස්තර:**

තම ස්ථිරව පදිංචි දිස්ත්‍රික්කයෙන් පිට දිස්ත්‍රික්කයක වසර 03කට වඩා සේවය කර ඇති නිලධාරීන්

**03. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය**

I. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)

II. සහකාර ලේකම් (ආයතන හා පුහුණු)

III. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ විෂය පථයට අයත් වන නිලධර කණ්ඩායම් වලට හා සේවාවට අයත් රජයේ නිලධරයන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණකාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධාරියෙකු මුදා හැර ඇති සෑම වෘත්තීය සංගමයකම නම් කළ නියෝජිතයෙක්.

**04. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය**

I. අතිරේක ලේකම් (පාලන)

II. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)

III. වෙනත් ආයතනයක මාණ්ඩලික නිලධාරියෙක්

**05.වාර්ෂික ස්ථාන මාරු ලබාදීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් කරුණු**

පහත සඳහන් අවස්ථා වාර්ෂික ස්ථාන මාරු කමිටුවක විෂය පථයට ඇතුලත් නොවන්නේය

I. විනය හේතු මත කරනු ලබන ස්ථාන මාරු
II. සේවා අවශ්‍යතාවය මත කරනු ලබන ස්ථාන මාරු
III. නිලධාරීන්ගේ ඉල්ලීම මත කරනු ලබන අන්‍යෝන්‍ය ස්ථාන මාරු

**06.වාර්ෂික ස්ථාන මාරු කාල සටහන**

| | කාර්යය | දිනය |
|---|---|---|
| 01 | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම | ජුනි මස 30 වන දිනට පෙර |
| 02 | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කිරීම | ජුලි මස 31 වන දිනට පෙර |
| 03 | අදාළ බලධරයා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාරදීම | අගෝස්තු මස 10 වන දිනට පෙර |
| 04 | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධාරියා වෙත ලිඛිතව භාරදීම | අගෝස්තු මස 31 වන දිනට පෙර |
| 05 | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම | සැප්තැම්බර් මස 15 වන දිනට පෙර |
| 06 | ස්ථාන මාරුවීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය | සැප්තැම්බර් මස 30 වන දිනට පෙර |
| 07 | වාර්ෂික ස්ථාන මාරු යෝචනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධරාරියා වෙත ලිඛිතව භාරදීම | ඔක්තෝබර් මස 15 වන දිනට පෙර |
| 08 | අවසාන ස්ථාන මාරුවීම් නියෝග ක්‍රියාත්මක කිරීම | නොවැම්බර් මස 01 වන දිනට පෙර |
| 09 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම | නොවැම්බර් මස 15 වන දිනට පෙර |
| 10 | වාර්ෂික ස්ථාන මාරු බලාත්මක කිරීම | ජනවාරි මස 01 වන දිනට පෙර |

**07. ස්ථාන මාරු තීරණ වලට එරෙහි අභියාචනා සම්බන්ධ ක්‍රියා පටිපාටිය**

7.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නනේ නම්, එම අභියාචනය ආකෘති පත්‍ර 03 A හා 03 B ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේය. තවද, තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමටද ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

7.2 රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාල පරිදි දෙපාර්තමේන්තු ප්‍රධාන හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතද යොමුකළ යුතු වන්නේය.තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදව තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකිරීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ වගකීම වන්නේය.නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

7.3 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය.කියමිත කාලය තුළදී නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4 කොමිෂන් සභාව වෙත යොමුකිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපිගොනු, ලිපිලේඛන හා වාර්තා ආදියද, ඊට අදාළ තම නිරීක්ෂණද, නිර්දේශද සහිත එම අභියාචනය ලැබී දින 15ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාල

දෙපාර්තමේන්තු ප්‍රධාන හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලා ගත යුතු වන්නේය.එතකුදු වුවත්,රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපිගොනු ,ලිපිලේඛන, වාර්තා ,නිරීක්ෂණ හා නිර්දේශ සමඟ නොවැම්බර් මස 15වැනි දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

7.5 මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචන ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සකා බලනු නොලබන්නේය.

7.6 ඉහත 7.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචකයා වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ පරිදි රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානී වෙත යවනු ලබන්නේය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

.........................................................

ලේකම්

රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05.

දිනය :

නිල මුද්‍රාව :